**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය**

**වෙළඳ නාවික ලේකම් කාර්යාලය**

# අභිලාශය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනාව (EOI)

## "ශ්‍රී ලංකා ධජය යටතේ නැව් ලියාපදිංචි කිරීම ප්‍රවර්ධනය කිරීමට" උනන්දුවක් දක්වන දේශීය හෝ විදේශීය සමාගම් හෝ පුද්ගලයන්ගෙන් අභිලාශය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනා කැඳවනු ලැබේ.

යොමු අංකය : **MSS/ACC/01/27-01**

## 1. අරමුණ

ශ්‍රී ලංකා ධජය යටතේ නැව් ලියාපදිංචි කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ එතෙර සිටින සමාගම් හෝ පුද්ගලයන් හඳුනා ගැනීම.

## 2. සුදුසුකම්

2.1. සුදුසුකම් ලත් සමාගම් හෝ පුද්ගලයන්,

- **2.1.1.** නැව් ලියාපදිංචියට අදාළ ව්‍යාපාර සිදුකිරීම සඳහා සිය මව් රටේ නීතිය යටතේ ලියාපදිංචි වී සිටිය යුතුය.
- **2.1.2.** අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද පිළිබඳ සනාථ කිරීමේ ලේඛණ ඉදිරිපත් කිරීමට හෝ
- **2.1.3.** ශ්‍රී ලංකා ධජය යටතේ නැව් ලියාපදිංචි කිරීම ප්‍රවර්ධනය සඳහා අපේක්ෂිත කාල රාමුවක් සමඟ යෝජනාවක්/ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමට හැකි වීම.

## 3. සුදුසුකම්ලත් සමාගම් හෝ පුද්ගලයන් සඳහා ලැබෙන ප්‍රතිලාභ

1971 අංක 52 දරණ වෙළෙඳ නැව් පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති රෙගුලාසිවලට අනුකූලව සහ වෙළඳ නාවික ලේකම් කාර්යාලය හා සමාගම් හෝ පුද්ගලයන් අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමේ නියම සහ කොන්දේසි ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ හෝ එතෙර සිටින සුදුසුකම් ලත් සමාගම්වලට හෝ පුද්ගලයන්ට, ශ්‍රී ලංකා ධජය යටතේ නැව් ලියාපදිංචිය

ප්‍රවර්ධනය සාර්ථකව සිදු කරනු ලබන කටයුත්තක් සඳහා ශ්‍රී ලංකා රජය (GOSL) විසින් ආකර්ෂණීය දිරිගැන්වීමේ දීමනාවක් ලබා දෙනු ඇත.

4. **EOI ලේඛන ලබා ගැනීම**

ඔබට, අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් http://www.portmin.gov.lk/
හෝ
වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියෙන් http://www.dgshipping.gov.lk/

EOI ලේඛනය බාගත කළ හැකිය

5. **EOI ඉදිරිපත් කිරීම සඳහා වන අවසාන දිනය**
සම්පූර්ණ කර මුද්‍රා තැබූ EOI, 2024 ජූලි 08 දින 14.00 ට පෙර, EOI ලේඛනයෙහි විස්තර කර ඇති ආකාරයට සහ පෝරමයෙහි සඳහන් ආකාරයට පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01, ශ්‍රී ලංකාව, හි පිහිටි වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ දී, කැබිනට් මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් EOI විවෘත කර ඇගයීමට ලක් කෙරේ.

**EOI ඉදිරිපත් කලයුතු ලිපිනය**

සභාපති,

කැබිනට් මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව.

වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,

අංක 19, චෛත්‍ය පාර,

කොළඹ 01,

ශ්‍රී ලංකාව.